# වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

# බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

# ඇබෑර්තු

ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ලේ පිහිටුවා ඇති බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතියෙහි පවත්නා පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

පත් කිරීම්, අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය (MSD) ප්‍රකාරව මූලිකව කොන්ත්‍රාත් පදනමින් එක් වසරක් සඳහා වන අතර, සතුටුදායක කාර්යසාධනය මත වාර්ෂිකව අලුත් කළ හැක. වයස අවුරුදු 64 ට වැඩි අයවලුන් බඳවා ගැනීමට සලකා බලනු නොලැබේ.

රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, අදාළ ප්‍රධානියා විසින් මෙම අයදුම්කරු නව තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරනු ලබන තනතුරින් පූර්ණ කාලීනව නිදහස් කළ හැකිද යන කරුණ නිර්දේශ කොට තිබිය යුතුය.

## නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර (තනතුරු 01) - PS 02

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකම් සමග පිලිගත් ඉංජිනේරු ආයතනයක ආයතනික / වරලත් සාමාජිකත්වය.

ඉංජිනේරු / කළමනාකරණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමක් වේ.

**සමග**

වසර 03 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ පළපුරුද්ද ඇතුළත්ව වසර 07 ක, කළමනාකරණ තලයේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**වැටුප් පරාසය**

රුපියල් 135,000.00 - රුපියල් 150,000.00 (මාසිකව) + රජයේ අනුමත දීමනා.

## ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්) තනතුර (තනතුරු 01) - PS 03

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

ඉංජිනේරු ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ සමාන සුදුසුකම් සමග පිලිගත් වෘත්තීය ආයතනයක වරලත් සාමාජිකත්වය සමග ව්‍යාපෘති ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 08 ක පළපුරුද්ද

**හෝ**

ඉංජිනේරු සේවාවේ 1 පංතිය නිලධාරියකු වීම හා 1 පංතිය තනතුරක වසර 02 ක පළපුරුද්ද.

FDIC හා NPA මාර්ගෝපදේශ භාවිතය පිලිබඳ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.

**වැටුප් පරාසය**

රුපියල් 125,000.00 - රුපියල් 140,000.00 (මාසිකව) + රජයේ අනුමත දීමනා.

## ඉංජිනේරු සහකාර (සිවිල්) (තනතුරු 01) - PS 06

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද (පහත 1 හෝ 2 හෝ 3)**

1) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගත් තාක්ෂණ හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ NVQ සුදුසුකම් 7 තලයට නොඅඩු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ව්‍යාපෘතිවල අවම වශයෙන් වසර 01 ක පළපුරුද්ද.

2) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගත් තාක්ෂණ හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ, NVQ සුදුසුකම් 6 තලයට නොඅඩු, [NDT, NDES, HNDE, OUSL (Dip)], සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ව්‍යාපෘතියකට අදාළව වූ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.

3) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගත් තාක්ෂණ හා වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව, NVQ සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද.

**වැටුප් පරාසය**

රුපියල් 50,000.00 - රුපියල් 63,000.00 (මාසිකව) + රජයේ අනුමත දීමනා.

## ව්‍යාපෘති ලේකම් (තනතුරු 01) - PS 06

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද (පහත 1 හෝ 2)**

1) ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂා ඇතුළත්ව සම්මාන සාමාර්ථ තුනක් (03) සහිතව අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

**සමග**

පිලිගත් ලේකම්කරණ ආයතනයක ලේකම්කරණ පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම,

**සමග**

ලේකම්වරයකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

2) සුදුසුකම් ලැබීමෙන් පසුව, වරලත් ලේකම්වරයකු ලෙසට වසර 02 ක ප්‍රායෝගික පළපුරුද්ද.

**වැටුප් පරාසය**

රුපියල් 58,000.00 - රුපියල් 63,000.00 (මාසිකව) + රජයේ අනුමත දීමනා.

## සැලසුම් ශිල්පී තනතුර (තනතුරු 01)

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

පිලිගත් සැලසුම් ශිල්පී ආයතනයක අවම වශයෙන් වසර එකක කාලයක සහතික පාඨමාලාවක් හදාරා තිබීම හා වසර 05 ක පළපුරුද්ද. වාරිමාර්ග ඉංජිනේරු ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.

NVQ සුදුසුකම් 5 හෝ 6 තලයේ සහතික හිමි අය PS 6 වැටුප් පියවරෙහි තබනු ඇත. AUTO CAD ඇඳීම් පළපුරුද්ද තිබිය යුතුමය.

**අයදුම්පත් :**

අයදුම්කරුගේ සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව, මූලික සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් සහිතව, ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ නිට්ටඹුව, රුග්ගහවිල, වල්පොල, අංක 104 ඒ/2 හි බස්නාගොඩ ජලාශ ව්‍යාපෘති කාර්යාලයේ, ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ගෙනැවිත් භාරදීමෙන්, 2020 **අගෝස්තු** 31 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

කෙටි ලැයිස්තු ගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලබයි. මේ සම්බන්ධයෙන් යම් බලපෑම් සිදු කිරීම නුසුදුස්සකු සේ සැලකීමට හේතුවන අතර, එම අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ඉංජි. අසන්ත ජී. සුමනරත්න**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය.**